වගා ආධාර චක්‍රලේඛ අංක 12:

තුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474,
කොළඹ.03.
1989.01.20

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත,

මාතෘකාව: තේ නැවත වගා සහ පාඨ සැපයීමේ ආධාර ක්‍රම යටතේ තේ වැවීමේදී සලකා බැලිය යුතු පරිපාලනමය කරුණු

1.0 චක්‍රලේඛයේ පරමාර්ථ:

1.1 තේ කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ඉඩම්වලට පමණක් තේ නැවත වගා සහ පාඨ සැපයීමේ ආධාර ක්‍රමයන් සීමා නොකොට එසේ ලියාපදිංචි නොවූ තේ ඉඩම් සඳහාද අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ වී ඇති විට නැවත වගා කිරීම/පාඨ සැපයීමට අවසරදීම.

1.2 තේ නැවත වගා/පාඨ සැපයීමේ ආධාර ක්‍රම යටතේ අවසරදීමේදී සලකා බැලිය යුතු අනෙකුත් පරිපාලනමය කරුණු පිළිබඳ දැනුවීම.

ක්‍රියා පිළිවෙත:

තේ වගාවට යෝග්‍ය ඉඩම් සම්බන්ධයෙන් තේ නැවත වගා/පාඨ සැපයීමේ ආධාර ක්‍රම යටතේ පහත දැක්වෙන කරුණු සපුරාලන ඉඩම් සඳහා අදාළ පරිදි අවසරපත්‍ර නිකුත් කරන්න.

2.1 වගා ආධාර චක්‍රලේඛ අංක 11 සහ 1989.01.20 දිනැති ' තේ වගාවට ඉඩම් යෝග්‍යතාව නිර්ණය ' යන මාතෘකාව යුත් චක්‍රලේඛය අනුව තේ වගා කිරීම සඳහා ක්ෂේත්‍ර යෝග්‍යතාවය තීරණය කරන්න. ඒ අනුව ඉඩම තේ වගාවට යෝග්‍ය විය යුතුය.

2.2 තේ නැවත වගා/පාඨ සැපයීමේ ආධාර ක්‍රම යටතේ සහභාගිවීම පිණිස පහත සඳහන් පරිදි අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ විය යුතුය.

2.2.1 තේ ඉඩමක් බවට තහවුරුවීම:

ඉඩම් තේ කොමසාරිස් අංශයේ ලියාපදිංචි කර තිබේනම් එම අංකය සහ බිම් ප්‍රමාණය ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර තිබීම

හෝ

අධිකාරියේ පෞද්ගලික තේ ඉඩම් ලේඛණයේ තේ ඉඩමක් ලෙස ලියාපදිංචිවී තිබීම. (වගා ආධාර චක්‍රලේඛ අංක 7 පරිදි)

දැනට අධිකාරියේ වගා ලේඛණයේ තොරතුරු ඇතුලත් වී නොමැති සියලු තේ ඉඩම් (තේ කොමසාරිස් අංශයේ ලියාපදිංචි කර ඇති හෝ නැති) පී.ආර්.1 ආකෘතිය මගින් තොරතුරු ලබාගෙන වගා ලේඛණයේ ඇතුලත් කිරීමට පියවර ගන්න.

තේ කොමසාරිස් අංශයේ ලියාපදිංචි ඉඩමක් ලෙස නැවත වගා ඉල්ලුම් පත්‍රයේ දක්වා ඇතිවිට එය සනාථ කරවා ගැනීමට තේ කොමසාරිස් කාර්යාලයෙන් විමසීම අවශ්‍ය නොවේ. කෙසේ වුවද තේ කොමසාරිස් අංශයේ ලියාපදිංචි වී නොමැති ඉඩම් සඳහා නැවත වගා අවසරපත්‍ර නිකුත් කරන අවස්ථාවේ දී එම ඉඩම්වල තොරතුරු අමුණා ඇති ආකෘතියේ (ඇමුණුම 1) තේ කොමසාරිස් වෙත මසකට වරක් දන්වන්න. එවැනි අවසරපත්‍ර වෙනුවෙන් ගෙවීම් කිරීමේ දී වගා ලේඛණයේ අනුක්‍රමික අංක යොදා දර්ශක පත්‍ර නඩත්තු කරන්න.

2.2.2 (ආ) ඉඩමේ හිමිකම/අයිතිය:

විධිමත්ව සම්පූර්ණ කරන ලද එන්.පී.2 ඒ. ආකෘතිපත්‍රය මගින් තහවුරු කළ යුතුය.

2.2.3 (ඇ) පූර්ව සහනාධාර ගෙවීම්:

තේ කොමසාරිස් කාර්යාලයෙන් ලබාදී ඇති දර්ශකපත්‍ර හා අධිකාරිය විසින්ම පවත්වා ගෙන යන දර්ශකපත්‍ර පිරික්සා බලා තහවුරු කර ගත යුතුය.

කුඩා තේ ඉඩම්වලට අදාල දර්ශක පත්‍ර සියල්ලක්ම තේ කොමසාරිස් කාර්යාලය මගින් ඔබ වෙත ලබා දී ඇත.

3.0 නැවත තේ වගා කෙරෙන සෑම ඉඩමක්ම දැනටමත් නිර්දේශිත පරිදි අනිවාර්යයෙන්ම පස සාරවත් කිරීමට යටත්ව අවසර දිය යුතුය.

4.0 මෙම චක්‍රලේඛය නිකුත් කරන්නේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් හා තේ කොමසාරිස්ගේ එකඟත්වය ඇතිවය.

ඒ. ජේ. නානායක්කාර
සභාපති

පිටපත්:-
1. ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
2. තේ කොමසාරිස්,
3. සාමාන්‍යාධිකාරී, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
4. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
5. සහකාර සාමාන්‍යාධිකාරී(මුදල්)
6. අභ්‍යන්තර විගණක
7. ලේකම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී
8. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්.

ශ්‍රී/01/24